නීතිඥ නාමල් රාජපක්ෂ (පා.ම)
சட்டத்தரணி நாமல் ராஜபக்ஷ (பா.உ)
NAMAL RAJAPAKSA (M.P)
Attorney-at-law

සංජීව විජේරත්න
'කාල්ටන් නිවස',
තංගල්ල.
2023.08.04

සභාපති
ලංකා විදුලිබල මණ්ඩලය,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

*සභාපතිතුමනි,*

**<u>සමාජ මාධ්‍ය මඟින් සංසරණය වන නොගෙවූ විදුලි බිල්පතකට අදාළ ලිපිය සම්බන්ධවයි</u>**

හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාගේ නම සඳහන් කරමින්, 2019 වර්ෂයට අදාළ නොගෙවූ හිඟ විදුලි බිල්පතක් සම්බන්ධව 2023 අගෝස්තු 02 දිනැති ඔබ ආයතනයේ ලිපි ශීර්ෂය යටතේ නිකුත් වූ ලිපියක් උපුටමින් විවේචනාත්මක හා අපහාසාත්මක තොරතුරු සමාජ මාධ්‍ය තුළ මේ දිනවල සංසරණය වෙමින් පවතී. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වානිජ හා ආයතනික - බෙදාහැරීම් අංශ 4) විසින් නිකුත් කරන ලද යැයි සඳහන් එම ලිපිය මේ සමඟ අමුණා ඇත.

ලංකා විදුලිබල මණ්ඩලය මඟින් නිකුත් කර ඇති බවට සමාජ මාධ්‍ය මගින් ප්‍රචාරය වන මෙම ලිපියට අදාලව, විදුලි බිල් පතක් ඉදිරිපත් කර ඇත්නම් එය කාගේ නමින්, කුමන දිනයක, කුමන ලිපිනයක් සඳහා යොමුකර ඇද්ද යන්න වගත්, එම බිල්පතෙහි නිවැරදි තොරතුරු ගරු මන්ත්‍රීතුමා වෙත ලබා දීමට කටයුතු කරන ලෙසත් මෙයින් ඉල්ලා සිටිමි.

ස්තූතියි.

සංජීව විජේරත්න
ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාගේ
සම්බන්ධීකරණ ලේකම්

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

ඔබගේ අංකය: මගේ අංකය: CEB/RTI/DD4/Sec.13B/2023/07/001 දිනය: 2023 අගෝස්තු මස 02 වැනිදා

නලින් හේවගේ මහතා,
කිංග්ස් කෝර්ට්,
පියදිගම, ගිංතොට,
ගාල්ල

මහත්මයාණෙනි,

**2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත**
**තොරතුරු ඉල්ලීම ලබාදීම -ලියාපදිංචි අංකය - CEB/RTI/DD4/Sec.13B/2023/07/001**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා විසින් ඔබ ඇමතූ මාගේ සමාංක හා ජූලි 04 දිනැති ලිපිය හා සබැඳේ.

ඒ අනුව, ඔබ විසින් 2023.06.26 දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දකුණු පළාත 01) වෙත යොමු කරන ලද තොරතුරු ඉල්ලීම සඳහා 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි 25(1) වගන්තිය අනුව එම ඉල්ලීමට අදාල තොරතුරු පහත සඳහන් පරිදි සැපයීමට තීරණය කරන ලද බව මෙයින් දන්වමි.

ඒ අනුව, හිටපු ජනපති මහින්ද රාජපක්ෂ මැතිතුමා 2019.09.12 දින සිට 2019.09.15 දින දක්වා වීරකැටිය නිවසේ පැවති උත්සවයකට සහභාගි වන බව දන්වා ආරක්ෂක පහන් සවිකරන මෙන් ඉල්ලා ඇත. ඒ අනුව තාවකාලික විදුලිය සපයා ආරක්ෂක පහන් සවිකර විදුලිය ලබාදී නැවත එම උපකරණ ගලවා ඉවත් කර ඇති අතර, ආරක්ෂක පහන් සවිකිරීම සහ ජනක යන්ත්‍ර සැපයීම වෙනුවෙන් රු. 26,82,246.57 ක වියදමක් දැරීමට සිදුව ඇතිබවත් එම වියදම් ඇස්තමේන්තු මුදල ගෙවීම් කරන ලෙස දන්වා ඇතත්, මෙතෙක් එම මුදල ගෙවීම් කර නොමැති බව කාරුණිකව දන්වා සිටිමි.

ඔබගේ ප්‍රශ්න වලට අදාලව ලබා දුන් තොරතුරු පිළිබඳව ඔබ එකඟ නොවන්නේ නම් පහත සඳහන් නම් කළ නිලධාරි හට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.

- නම : ඉංජිනේරු හේමන්ත රණසිංහ මහතා
- තනතුර : අතිරේක සාමාන්‍යාධිකාරී ( ආයතනික ක්‍රමෝපාය)
- ලිපිනය : 6 වැනි මහළ, ලංකා විදුලිබල මණ්ඩල ප්‍රධාන කාර්යාලය,
  අංක.50, සර්. චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 00200

ස්තූතියි.
මෙයට විශ්වාසී වූ,
ලංකා විදුලිබල මණ්ඩලය

ඉංජිනේරු වී.වී ජනෙත්
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
වාණිජ හා ආයතනික - බෙ.අංශ 04

ඉංජිනේරු වී. වී. ජනෙත්
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ හා ආයතනික - බෙදාහැරීම් අංශ 4)
තොරතුරු නිලධාරී - බෙදාහැරීම් අංශ 4

පිටපත :
අ.සා (ආ.ක්‍රි) / අ.සා (බෙ.අ 4) - ඔබගේ කාරුණික දැනගැනීම සඳහා
ප්‍ර.ඉ(තංගල්ල)/නි.සා (ද.ප 2) - කඩිනමින් පිළිතුරු සැපයීම බොහෝ සේ අගය කොට සලකමි.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ හා ආයතනික - බෙදාහැරීම් අංශ 04)

ලංකා විදුලිබල මණ්ඩලය, නො. 25, නගර සභා පටුමග, දෙහිවල 10350, ශ්‍රී ලංකාව.
දු.ක: +94 11 4204014 / ෆැක්ස්: +94 11 2726591 | විද්‍යුත් ලිපිනය: dgmccdd4@ceb.lk | www.ceb.lk |